# කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
# விவசாயத் திணைக்களம்
# Department of Agriculture

| මගේ අංකය<br>எனது எண்<br>My No. | කෘදෙ/පා/1/12/3/3 | ඔබේ අංකය<br>உமது எண்<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2020.09.11 |
|---|---|---|---|---|---|

සියළුම අධ්‍යක්ෂවරුන් /පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන්,

**<u>කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් රාජ්‍ය අමාත්‍යාංශ යටතේ පවතින ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ තනතුරු වල වැඩ බැලීම සඳහා මනාපය පළ කිරීම</u>**

කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ පවතින රාජ්‍ය අමාත්‍යාංශ සඳහා අනුමත කර ඇති ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ පහත සඳහන් තනතුරු වලට වැඩ බැලීමේ පදනමක් මත පත් කිරීම සඳහා ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් මනාපය විමසීමට කටයුතු කරනු ලැබේ.

| අංකය | තනතුරු කාණ්ඩය | තනතුර අයත් ශ්‍රේණිය (ශ්‍රී ලං.කෘ.සේ.) | තනතුරු කාණ්ඩයට අයත් මුළු පුරප්පාඩු සංඛ්‍යාව | අනු අංකය | පුරප්පාඩුව පවතින තනතුර | පුරප්පාඩුව පවතින තනතුර අයත් ධාරාව |
|---|---|---|---|---|---|---|
| 1 | අතිරේක ලේකම් | විශේෂ | 2 | 1.1 | අතිරේක ලේකම්, වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පලතුරු, මිරිස්, ලූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධනය, බීජ නිෂ්පාදනය හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය | කෘෂි සංවර්ධන/ කෘෂි පර්යේෂණ/ කෘෂි ආර්ථික විද්‍යා |
| | | | | 1.2 | අතිරේක ලේකම්, පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන සහ කිරි, බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය | |
| 2 | අධ්‍යක්ෂ ජනරාල් | විශේෂ | 1 | 2.1 | අධ්‍යක්ෂ ජනරාල්, පොහොර නිෂ්පාදන හා සැපයුම්, රසායනික පොහොර හා කෘමිනාශක භාවිත නියාමන රාජ්‍ය අමාත්‍යාංශය | කෘෂි සංවර්ධන/ කෘෂි පර්යේෂණ/ කෘෂි ආර්ථික විද්‍යා |
| 3 | අධ්‍යක්ෂ | I | 4 | 3.1 | අධ්‍යක්ෂ, පොහොර නිෂ්පාදන හා සැපයුම්, රසායනික පොහොර හා කෘමිනාශක භාවිත නියාමන රාජ්‍ය අමාත්‍යාංශය (තනතුරු 1) | කෘෂි සංවර්ධන/ කෘෂි පර්යේෂණ/ කෘෂි ආර්ථික විද්‍යා |
| | | | | 3.2 | අධ්‍යක්ෂ, වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පලතුරු, මිරිස්, ලූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධනය, බීජ නිෂ්පාදනය හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය (තනතුරු 3) | |


තැ.පෙ. අංක 01 / த.பெ.இல. 01 / P.O. Box 01
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව / விவசாயத் திணைக்களம் / Department of Agriculture
ප්‍රධාන කාර්යාලය / தலைமைக் காரியாலயம் / Head Office
පේරාදෙණිය, ශ්‍රී ලංකා / பேராதனை, இலங்கை / Peradeniya, Sri Lanka
පොදු කාර්යාලය / தலைமைக் காரியாலயம் / General Office — (94)81-2388331, (94)81-2388332, (94)81-2388334

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General — (94)81-2388157
ෆැක්ස් தொலை நகல் Fax: (94)81-2388333
ඊ මේල් ஈ மெயில் E-mail: dgagriculture@gmail.com

අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන) / மேலதிக பணிப்பாளர் நாயகம் (நிர்வாகம்) / Additional Director General (Administration) — (94)81-2388181
ෆැක්ස් தொலை நகல் Fax: (94)81-2388042
ඊ මේල් ஈ மெயில் E-mail: addldga@agridept.gov.lk

අධ්‍යක්ෂ (පාලන) / பணிப்பாளர் (நிர்வாகம்) / Director (Administration) — (94)81-2386485
ෆැක්ස් தொலை நகல் Fax: (94)81-2388042
ඊ මේල් ஈ மெயில் E-mail: dadmin@agridept.gov.lk

02. නිලධාරීන් විසින් සම්පූර්ණ කර එවිය යුතු ආදර්ශ ආකෘතිය (ඇමුණුම 1) මේ සමඟ අමුණා එවා ඇති අතර, මෙම ආකෘතිය 2020.09.15 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ මා වෙත එවිය යුතු වේ. මේ සම්බන්ධයෙන් ඔබ ආයතනය/පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන සියළු ඒකක වලට අයත් ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ නිලධාරීන් දැනුවත් කරන ලෙස දන්වමි. තව ද මෙම නිවේදනය දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවියේ පළ කර ඇති බවට සියළු ඒකක වලට අයත් නිලධාරීන් දැනුවත් කරන ලෙසත් කාරුණිකව දන්වමි.

03. මෙම ක්‍රියාවලිය වැඩ බැලීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා පමණක් යොදා ගන්නා වැඩපිළිවෙලක් වන අතර, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉදිරි කාලයේ දී විධිමත් ලෙස අයදුම්පත් කැඳවා පත්වීම් සිදු කිරීමේ දී මෙම වැඩ බැලීමේ පත්වීම ස්ථිර පත්වීමක් ලබා ගැනීම සඳහා විශේෂ සුදුසුකමක් නොවන බව ද කාරුණිකව දන්වමි.

ආචාර්ය ඩබ්.එම්.ඩබ්. වීරකෝන්,
කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්

ආචාර්ය ඩබ්.එම්.ඩබ්. වීරකෝන්
කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
පේරාදෙණිය.

පිටපත:- ලේකම් ,
කෘෂිකර්ම අමාත්‍යාංශය - මෙම මනාපය විමසීම සම්බන්ධයෙන් ඔබගේ ආවරන අනුමැතිය ලබා දෙන ලෙස කාරුණිකව ඉල්ලමි